# ශ්‍රී ලංකා වරාය අධිකාරිය
## දැන්වීමයි

මගේ අංකය :මාසකො/විධා0/6/20

පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති තම තනතුරේ ස්ථිර වූ මෙම අධිකාරියේ සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ .

01 **තනතුර : නියෝජ්‍ය ප්‍රධාන කළමනාකරු (සන්නිවේදන හා මහජන සම්බන්ධතා) (ජ්‍යෙෂ්ඨ කළමනාකරණ දෙවන මට්ටම) - SLM 2**

I. **වැටුප් කාණ්ඩය : (SLM 2)**

මූලික වැටුප : රු 120,040/ =
වැටුප් වර්ධකය : රු 2,155/=

II **(අ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ජන සන්නිවේදනය පිළිබඳ හෝ ඒ හා සමාන පශ්චාත් උපාධියක්/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්

**සමඟ**

**පළපුරුද්ද**

SLM 3 වැටුප් කාණ්ඩයේ එක් (01) වසරක ක්‍රියාකාරී පළපුරුද්ද

**හෝ**

**(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ජන සන්නිවේදනය පිළිබඳ උපාධියක්

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ඩිප්ලෝමාවක්/ සාමාජිකත්වයක් (ඩිප්ලෝමා කාල සීමාව වසර එක 01ක් විය යුතුයි)

**සමඟ**

**පළපුරුද්ද :**

SLM 3 වැටුප් කාණ්ඩයේ වසර දෙක (02) ක ක්‍රියාකාරී පළපුරුද්ද

02 **තනතුර : සහකාර කළමනාකරු (සන්නිවේදන හා මහජන සම්බන්ධතා) (මධ්‍යම කළමනාකරණ දෙවන මට්ටම) –MLM2**

I. **වැටුප් කාණ්ඩය: (MLM 2)**

මූලික වැටුප : රු 82,505/ =
වැටුප් වර්ධකය : රු 1,585/=

II. **(අ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ජන සන්නිවේදනය හෝ ඒ හා සමාන උපාධියක්

**සමඟ**

**පළපුරුද්ද**

JLM වැටුප් කාණ්ඩයේ තනතුරක වසර එක (01) ක ක්‍රියාකාරී පළපුරුද්ද

**හෝ**

**(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාල ඩිප්ලෝමාවක් (ඩිප්ලෝමා කාල සීමාව වසර එක 01ක් විය යුතුයි)

**සමඟ**

**පළපුරුද්ද**

JLM වැටුප් කාණ්ඩයේ තනතුරක වසර දෙක (02) ක ක්‍රියාකාරී පළපුරුද්ද

**හෝ**

**(ඇ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාල ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක් (ඩිප්ලෝමා කාල සීමාව වසර එක 01ක් විය යුතුයි)

02පිටුවට......

**සමඟ**

**පළපුරුද්ද**
JLM වැටුප් කාණ්ඩයේ තනතුරක වසර පහ (05) ක ක්‍රියාකාරී පළපුරුද්ද

03 **තනතුර :කණිෂ්ඨ කළමනාකරු (සන්නිවේදන හා මහජන සම්බන්ධතා) (කණිෂ්ඨ කළමනාකරණ මට්ටම) – JLM**

I. **වැටුප් කාණ්ඩය: (JLM)**
මූලික වැටුප : රු 75,065/ =
වැටුප් වර්ධකය : රු 1,440/=

II. (අ) **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**
පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ජන සන්නිවේදනය හෝ ඒ හා සමාන උපාධියක්

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාල ඩිප්ලෝමාවක් (ඩිප්ලෝමා කාල සීමාව වසර එක 01ක් විය යුතුයි)

**සමඟ**

**පළපුරුද්ද**
වරාය අධිකාරියේ වසර තුන (03) ක ක්‍රියාකාරී සේවා කාලයක් සපුරා තිබීම

**හෝ**

(ආ) **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**
පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාල ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක් (ඩිප්ලෝමා කාල සීමාව වසර එක 01ක් විය යුතුයි)

**සමඟ**

**පළපුරුද්ද**
වසර පහ (05) ක ක්‍රියාකාරී සේවා කාලයක් සහිත SG වැටුප් කාණ්ඩයේ අයෙකු වීම

**හෝ**

(ඇ) **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**
දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල /දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි විෂයන් සම්මාන සාමාර්ථ සහිතව සමත්වීම

**සමඟ**

**පළපුරුද්ද**
වසර දහය (10) ක ක්‍රියාකාරී සේවා කාලයක් සහිත SG වැටුප් කාණ්ඩයේ අයෙකු වීම

III. **තෝරා ගැනීමේ විශේෂ නිර්නායක**
කාර්ය සාධන ඇගයීම සතුටුදායක මට්ටමක තිබිය යුතුයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියළුම නීති රීති වලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළ යුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි දිවයිනේ ඕනෑම පෙදෙසක හෝ අධිකාරියේ ඕනෑම කොට්ඨාශයක/ අංශයක සේවය කිරීමට බැදී සිටී.

ආදර්ශ ආකෘතිපත්‍ර ප්‍රකාරව සකසන ලද අයදුම්පත් 2024-07-31 වෙනි දින හෝ ඊට පෙර ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) වෙත ලැබෙන සේ අදාළ කොට්ඨාශ/ අංශ ප්‍රධානියා මගින් එවිය යුතු වේ. ඒ සමඟ අධ්‍යාපන හා වෘත්තීය සහතිකවල පිටපත්ද අමුණා එවිය යුතු අතර, අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් හා මෙම දැන්වීමේ අවශ්‍යතාවයන්ට සෑම අයුරින්ම අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

නියමිත දිනෙන් පසුව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රමාදවීමට තුඩුදුන් කරුණු අදාළ කොට්ඨාශ ප්‍රධානීන් විසින් සඳහන් කළයුතු අතර, එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)**
2024-07- 12 වෙනි දින.
මානව සම්පත් කොට්ඨාශයේදීය.